## අයර්ලන්තය

# මගේ පුද්ගලික දත්ත යුරෝඩැක් වෙත සම්ප්‍රේෂණය කරන්නේ ඇයි?

A ප්‍රකාරය

**ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවන්**



SINHALESE

## මට මෙම විස්තර පත්‍රිකාව ලැබෙන්නේ ඇයි?

ඔබ මේ රටේ රැකවරණය ලෙස ද හැඳින්වෙන ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කර තිබේ.

මෙම විස්තර පත්‍රිකාව බලධාරීන් විසින් ගබඩා කරගනු ලබන දත්ත පිළිබඳ ව සහ ඒ කොපමණ කාලයක් සඳහා ද යන්න පිළිබඳ ව වැඩිදුර තොරතුරු ලබා දෙයි.

## මට මගේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබා දීමට සිදුවන්නේ ඇයි?

මේ රටේ බලධාරීන් ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූප ලබා ගනු ඇත. මෙම දත්ත, ඔබේ අනන්‍යතාවය පිළිබඳ ව තොරතුරු සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ යුරෝඩැක් දත්ත සමුදාය වෙත සම්ප්‍රේෂණය කෙරෙනු ඇත.

යුරෝඩැක් EU+ රටක ජාතිකයන් නොවන ඇතැම් කාණ්ඩවල පුද්ගලයින්ව ඔවුන්ගේ අනන්‍ය ඇඟිලි සලකුණු සහ ඡායාරූප කට්ටලය හා සම්බන්ධ කරයි.

මෙම දත්ත සමුදාය EU+ රටවල් 31ක් විසින් භාවිත කරනු ලබන අතර ඔවුන්ට ඔබේ දත්ත සැකසීමේ සහ ඔබේ තොරතුරු ලබාගැනීමේ හැකියාව ඇත. EU+ රටවල් මෙම විස්තර පත්‍රිකාව අවසානයේ ලැයිස්තුගත කර ඇත.

# රැකවරණ සහ සංක්‍රමණ කළමනාකරණ නියාමනය යනු කුමක්ද?



EU+ රටවල් රැකවරණ සහ සංක්‍රමණ කළමනාකරණ නියාමනය ලෙස හඳුන්වන පොදු නීතියකට එකඟ වී තිබේ. ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන අයදුම්පතක් පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු රට තීරණය කිරීමට මෙම නීතිය උපකාරී වේ. එක් රටකට එකවර පමණ ඉක්මවා අයදුම්පත් ලැබෙන්නේ නම්, EU+ රටවලට එකිනෙකාට උපකාර කිරීමට ද මෙම නීතිය ඉඩ සලසයි.

EU+ රටවලින් එක රටක් ඔබේ අයදුම්පත පරීක්ෂා කරන බවට ඔබට සහතික වන නමුත් වගකිව යුත්තේ කුමන EU+ රට ද යන්න ඔබට තෝරා ගත නොහැකිය. ඔබේ අයදුම්පත පරීක්ෂා කරන රට තීරණය කරනු ලබන්නේ රැකවරණ සහ සංක්‍රමණ කළමනාකරණ නියාමනයෙහි ඇති රීතීන් මඟිනි.

ඔබ අවසරයකින් තොරව වෙනත් EU+ රටකට ගමන් කර ඔබේ දත්ත නැවත ලබා ගනු ලැබුවේ නම්, යුරෝඩැක්හි ගබඩා කර ඇති ඔබේ සියලුම දත්ත එම රටේ බලධාරීන් විසින් දකිනු ඇත.

**ඔබ දැන් අයර්ලන්තය හි සිටින අතර, එය EU රටකි.**
**EU+ රටවල් වන්නේ:**

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ, ස්විට්සර්ලන්තය.

## යුරෝඩැක්හි ගබඩා කර ඇති තොරතුරු මොනවාද?



පහත සඳහන් තොරතුරු සැමවිටම ගබඩා කෙරේ:

- ඔබේ ඇඟිලි සලකුණු
- ඔබේ මුහුණේ ඡායාරූපයක්
- ඔබ දැන් භාවිත කරන හෝ අතීතයේ භාවිත කර ඇති සියලුම නම්
- ඔබේ උපන් දිනය
- ඔබේ උපන් ස්ථානය
- ඔබේ ජාතිකත්වය හෝ ජාතිකත්වයන්
- ඔබේ ස්ත්‍රී පුරුෂභාවය
- ඔබ භාවිත කර තිබෙන අනන්‍යතා හෝ සංචාරක ලේඛනවල පිටපත්, තිබේ නම්, ඒවායේ සත්‍යතාව පිළිබඳ ව තොරතුරු ඇතුළුව
- ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබාගත් නිලධාරියාගේ පරිශීලක හැඳුනුම සහ ඔබේ දත්ත ලබාගෙන සම්ප්‍රේෂණය කළ දිනයන්
- ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කළ රට
- ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කළ දිනය.

අවශ්‍ය විටෙක පහත තොරතුරු ද යුරෝඩැක්හි ගබඩා කරනු ඇත:

- ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීමට වගකිව යුතු රට
- ඔබ නැවත පදිංචි කරවා ඇත්නම්, නැවත පදිංචි කරවන ලද EU+ රට
- ඔබේ අයදුම්පත ප්‍රතික්ෂේප වී තිබේ නම් සහ ඔබට EU+ රටවල රැඳී සිටීමේ අයිතිය නොමැති නම්
- ඔබේ අයදුම්පත දේශසීමා ක්‍රියාපටිපාටිය යටතේ සලකා බලා ප්‍රතික්ෂේප කර ඇත්නම් හෝ ඔබේ අයදුම්පත ඉල්ලා අස්කර ගත් අයදුම්පතක් සලකන්නේ නම්
- EU+ රටක් විසින් ඔබට නිකුත් කරන ලද ඕනෑම වීසා බලපත්‍රයක් පිළිබඳ තොරතුරු
- ඔබ EU+ රටවල කලාපයෙන් පිටව ගිය ඕනෑම වේලාවක තොරතුරු
- ඔබ ස්වේච්ඡාවෙන් ඔබේ මව් රටට ආපසු යාමට ඉදිරිපත් වූ යෝජනාවක් පිළිගනු ලැබුවේ ද යන්න පිළිබඳ තොරතුරු.

යුරෝඩැක්හි ගබඩා කර ඇති සාවද්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ සංශෝධනය කිරීමත් එය නීති විරෝධී ලෙස හසුරුවා ඇත්නම් ඔබේ තොරතුරු මකා දැමීමට ඉල්ලා සිටීමත් ඔබට අයිතිය ඇත. මෙය සිදු කිරීම සඳහා ඔබට දත්ත පාලකය සම්බන්ධ කර ගත හැකිය. දත්ත පාලකයේ සම්බන්ධතා තොරතුරු ‘**යුරෝඩැක් පිළිබඳ ව ඔබ**

## මගේ පුද්ගලික දත්ත යුරෝඩැක්හි කොපමණ කාලයක් ගබඩා කර තිබෙනු ඇති ද?



ඔබේ තොරතුරු වසර 10ක් ගබඩා කර තබාගෙන පසුව ස්වයංක්‍රීයව මකා දමනු ඇත.

මෙම කාල සීමාව ඉකුත්වීමට පෙර ඔබ EU+ රටක පුරවැසිභාවය ලබා ගන්නේ නම්, ඔබේ දත්ත මකා දැමෙනු ඇත. ඔබේ දත්ත මකා දැමුවහොත්, ඔබ පුරවැසිභාවය ලැබූ රටෙහි ඔබේ තත්ත්වයට මෙය බලපාන්නේ නැත.

## යුරෝඩැක්හි වෙනත් තොරතුරු ගබඩා කර තිබේ ද?

බලධාරීන් ඔබට පහත සඳහන් දේ කළ හැකි බව සොයා ගන්නේ නම්, ඔබේ ආරක්ෂක පරීක්ෂාවේ ප්‍රතිඵලය ගබඩා කර තබනු ඇත:

- ආයුධයක් ළඟ තබාගත හැකි නම්
- ප්‍රචණ්ඩකාරී විය හැකි නම්
- ත්‍රස්තවාදී අපරාධවලට සම්බන්ධ වී තිබේ නම්
- වෙනත් EU+ රටක ඔබව අත්අඩංගුවට ගත හැකි බරපතල අපරාධයක් කර තිබේ නම්.

එවැනි අවස්ථාවල දී, ඔබ අභ්‍යන්තර ආරක්ෂාවට තර්ජනයක් විය හැකි බවට සැලකේ. මෙය ඉහත විස්තර කර ඇති අදාළ හේතුව හෝ හේතූන් සමඟ යුරෝඩැක්හි ගබඩා කර තබනු ඇත.

EU+ රටවල් තවදුරටත් ඔබව අභ්‍යන්තර ආරක්ෂාවට තර්ජනයක් ලෙස නොසලකන්නේ නම්, මෙම තොරතුරු මකා දැමෙනු ඇත.

යුරෝඩැක්හි ගබඩා කර ඇති සාවද්‍ය තොරතුරු වෙත ප්‍රවේශ වීමට සහ සංශෝධනය කිරීමත් එය නීති විරෝධී ලෙස හසුරුවා ඇත්නම් ඔබේ තොරතුරු මකා දැමීමට ඉල්ලා සිටීමත් ඔබට අයිතිය ඇත. මෙය සිදු කිරීම සඳහා ඔබට දත්ත පාලකය සම්බන්ධ කර ගත හැකිය. දත්ත පාලකයේ සම්බන්ධතා තොරතුරු '**යුරෝඩැක් පිළිබඳ ව ඔබ දැනගත යුතු දේ**' යන විස්තර පත්‍රිකාවෙන් සොයාගත හැකිය.

මෙම සටහන දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමගින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මගින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025